00019

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2024/2025
අවසාන පරීක්ෂණය - 2025
SNP8246/SNP8336- විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ නව ප්‍රවණතා
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2025.07.26 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

1. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ අයිතිවාසිකම් සඳහා සහාය වන වැදගත් ගෝලීය ලේඛන තුනක් (03) හඳුනා ගන්න.

2. පුද්ගල පර්යාලෝක ඔස්සේ අධ්‍යාපන පද්ධතියේ කාර්යභාරයන් තුනක් (03) ලැයිස්තුගත කරන්න.

3. දූරස්ථ අධ්‍යාපනය මගින් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට ඉගෙනුම් අවස්ථා ඵලදායී ලෙස ලබා ගැනීමට හැකි වන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

4. විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා නොවිධිමත් අධ්‍යාපනයේ වාසි පහක් (05) සඳහන් කරන්න.

5. විශේෂ පාසල් පද්ධතියේ මූලික කාර්යයන් දෙක (02) කුමක්ද?

6. අන්තර්කරණ අධ්‍යාපනය බොහෝ විට කණ්ඩායම් ප්‍රවේශයක් ලෙස හැඳින්වේ.මෙම ප්‍රකාශයේ අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

7. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (UNCRC) සඳහන් පරිදි විශේෂ තත්ත්ව යටතේ ස්ථානගතකළ දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන වගන්ති පහක් (05) සඳහන් කරන්න.

8. 1990 න් පසු ශ්‍රී ලංකාව විසින් "සැමට අධ්‍යාපනය" යන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 05x08 = ලකුණු 40)

## 2 වන කොටස

9. (i) විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය යන සංකල්පය පැහැදිලි කර, එය සාමාන්‍ය අධ්‍යාපනයෙන් වෙනස් වන්නේ කෙසේද යන්න විස්තර කරන්න. (ලකුණු 05)

(ii) "සැමට අධ්‍යාපනය" ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර්කරණ අධ්‍යාපනයේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 07)

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධාරාවේ පාසල්වල අන්තර්කරණ අධ්‍යාපන පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට ඇති බාධා පැහැදිලි කර, එම බාධක ජය ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

10. (i) අධ්‍යාපනය, පුද්ගල සංවර්ධනයට සහ සමාජ සංවර්ධනයට දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) අධ්‍යාපනය සහ සමාජයක ආර්ථික ව්‍යුහය අතර අන්තර් සම්බන්ධතාවය විස්තර කරන්න. (ලකුණු 07)

(iii) "විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ නව ප්‍රවණතා ලෙස විෂයමාලා අනුවර්තනය (Curriculum adaptation), ඉගැන්වීම් විවිධාංගීකරණය (differentiated instruction) සහ ඉගෙනීම සඳහා විශ්වීය නිර්මාණ (Universal Design for Learning) සැලකේ." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

11. (i) විධිමත්, අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනයේ ලක්ෂණ උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට යාවජීව අධ්‍යාපනය (lifelong education), සහය වන්නේ කෙසේද යන්න විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

(iii) දුබලතා සහිත පුද්ගලයින් සවිබල ගැන්වීම සඳහා වෘත්තීය අධ්‍යාපනයේ (career education) කාර්යභාරය විමර්ශනය කරන්න. (ලකුණු 08)

12. (i) 1990 න් පසු ශ්‍රී ලංකාවේ "සැමට අධ්‍යාපනය" සහතික කිරීම සඳහා හඳුන්වා දුන් ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විමර්ශනය කරන්න. (ලකුණු 05)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ප්‍රධාන ධාරාවේ අධ්‍යාපනයට ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ උත්සහායන් විස්තර කරන්න. (ලකුණු 07)

(iii) අන්තර්කරණ අධ්‍යාපන ඉලක්ක සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

13. (i) අන්තර්කරණ අධ්‍යාපනයේ ඓතිහාසික වර්ධනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) අන්තරකරණ අධ්‍යාපනයේ මූලධර්ම පැහැදිලි කර ප්‍රධාන ධාරාවේ පාසල්වල ඒවායේ භාවිත පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) අන්තර්කරණ භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේදී ගුරුවරුන්ගේ භූමිකාවන් සහ වගකීම් විස්තර කරන්න. (ලකුණු 08)

14. (i) "විශේෂ තත්ත්ව යටතේ ස්ථානගතකළ දරුවන්" යනු කවරේදැයි උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) විශේෂ තත්ත්ව යටතේ ස්ථානගතකළ දරුවන්ගේ අයිතිවාසිකම් වඩා හොඳින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති හා භාවිත වල සිදුකළ යුතු වෙනස්කම් විමර්ශනය කරන්න. (ලකුණු 07)

(iii) UNICEF (2006) අනුව, විශේෂ තත්ත්ව යටතේ ස්ථානගතකළ දරුවන් සම්බන්ධයෙන් ගෝලීය ප්‍රවණතා පැහැදිලි කරන්න. (ලකුණු 08)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*